# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1876/35 – 2014 අගෝස්තු 21 වැනි බ්‍රහස්පතින්දා – 2014.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/13/21/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. සමරසිංහ මයා, "සාම නිවස", ගංගොඩගම, හක්මණ.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 05, කිරුලපන ඇවනිව්, අංක 153/1හි, වී. විමලරාජා මහතා පත්කර ඔහුවෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.


1A – G 20099 – 100 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/13/21/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. සමරසිංහ මයා, "සාම නිවස", ගංගොඩගම, හක්මණ

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ දෛනික වැටුප් ලබන කොන්දොස්තරවරයකු ලෙස සේවය කළ ඩී. සමරසිංහ මහතා හට 2009.04.10 දිනැති 2009 අංක 01 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මුදල් කොට්ඨාස චක්‍රලේඛනය අනුව ජීවන වියදම් දීමනාව නොගෙවීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳවද වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
වැ.බ. කම්කරු කොමසාරිස්.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 142

---

මගේ අංකය: IR/12/02/2005 (SUB).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

ජී. එච්. උදය සමන් මයා, අංක 213/39, බාලිකා නිවාස පාර, රුක්මලේ, පන්නිපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77 හි ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/12/02/2005 (SUB).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ජී. එච්. උදය සමන් මයා, අංක 213/39, බාලිකා නිවාස පාර, රුක්මලේ, පන්නිපිටිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයේ නියැදි නිලධාරි / තාක්ෂණික සහකාර ලෙස සේවය කරනු ලබන ජී. එච්. උදය සමන් මයා 1994.07.13 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි නියැදි නිලධාරි / තාක්ෂණික සහකාර II ශ්‍රේණියේ පිහිටුවීමට සහ 2003 වර්ෂයේ දී නියැදි නිලධාරි I ශ්‍රේණිය ලබා ගැනීම වෙනුවෙන් ද, එසේම 2006 වසරේ දී ආයතනයේ වැටුප් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ දී ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරි තනතුර හා සහකාර අධ්‍යක්ෂ තනතුර ලබාගැනීම වෙනුවෙන් ද කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද, එසේ යුක්ති සහගත නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
වැ. බ. කම්කරු කොමසාරිස්.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 143

---

මගේ අංකය: අයිආර්/13/12/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. උපාලි ජයනෙත්ති මහතා, මිරිහාන කන්ද, කළුගල, ගුරුඑබැද්ද.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213 හි එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/13/12/2012.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී. උපාලි ජයනෙත්ති මහතා, මිරිහාන කන්ද, කළුගල, ගුරුළුබැද්ද.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මතුගම ඩිපෝවේ සේවයේ නියුතු ඩී. උපාලි ජයනෙත්ති මහතාට විනය පරීක්ෂණය අවසානයේදී 2011.12.22 දිනැති අභියාචනා නියෝගය පරිදි ලබාදී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
වැ.බ. කම්කරු කොමසාරිස්.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 144

---

මගේ අංකය: IR/13/09/2012.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

ටී. එච්. ශ්‍රීලාල් ප්‍රේමා ප්‍රනාන්දු මයා, කුරුන්ද, කාලවිල, බේරුවල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/09/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ටී. එච්. ශ්‍රීලාල් ප්‍රේමා ප්‍රනාන්දු මයා, කුරුන්ද, කාලවිල, බේරුවල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර මධ්‍යම අභ්‍යාස විද්‍යාලයේ සම්පාදන නිලධාරී ලෙස සේවය කළ ටී. එච්. ශ්‍රීලාල් ප්‍රේමා ප්‍රනාන්දු මහතාට 2010.01.18 දිනැති අංක 2010/02 දරන ශ්‍රී ලංගම මුදල් කොට්ඨාස චක්‍රලේඛයේ සඳහන් ජීවන වියදම් දීමනාව 2010 ජනවාරි මස සිට 2010 ජූනි මාසය දක්වා මසකට රු. 750/- (රුපියල් හත්සිය පනහ) බැගින් නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ලබා දිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
වැ. බ. කම්කරු කොමසාරිස්.

2014 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 145

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.